# රන් කොණ්ඩය



සවිතා රණවීර

කෘතියේ නම :- රන් කොණ්ඩය

කතෘගේ නම :- සවිතා රණවීර

කතෘ අයිතිය :- ISBN 978-624-208-002-4

කතෘගේ වෙනත් කෘති :- පුංචි සුරංගනාවිය (2020)

කෘතිය පල කරන දිනය:- 2023.12.24

# පිදුම

සෑම අතින්ම පොහොසත් වූ සමාජයක්

බිහිකරලීමේ

උදාර කටයුත්ත,

සිදු කරමින් අප ඔපවත් කරන,

මහාමායා බාලිකා විද්‍යාලයේ

විදුහල්පතිතුමී සහ මගේ පංති භාර

ගුරුතුමිය ඇතුළු සියළුම ගුරු මඬුල්ලට

උපහාරයක් ලෙස මේ පොත් පිංච

පිළිගන්වමි.... !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023.10.20**

එකෝමත් එක මාලිගාවක ලස්සන කුමාරිකාවෝ දෙන්නෙක් ඉපදුනා.



එක කුමාරිකාවක්ගේ කොන්ඩය රිදී පාටයි. ඒත් අනිත් කුමාරිකාවගේ කොන්ඩය රන් පාටයි.

රජතුමා වැඩියෙන්ම ආදරය කරේ රන් කොන්ඩය ඇති දරුවාට.ඒ වුනත් රැජිනිය දෙදෙනාටම එකවගේ ආදරය කළා.



රන් කොන්ඩය ඇති දරුවාට නම තැබුවේ සෙනූ කියලා. රිදී කොන්ඩය ඇති දරුවාට නම තැබුවේ යෙනූ කියලා.



සෙනුගේ වැඩ හැමදාම කරන්න සේවිකාවෝ ගොඩක් හිටියා.



ඒත් යෙනුගේ වැඩ යෙනුගේ පොඩි කාලේ විතරක් කරන්න එක සේවිකාවෙක් සිටියා.



අවුරුදු විස්සක් ගත වුණා. සෙනුගෙයි යෙනුගෙයි මව මරණයට පත්වුණා. සෙනුයි යෙනුයි ඔවුන්ගේ පියත් හොදටම ඇඩුවා



අවුරුදු හතරක් ගත වුණා. පියා සෙනූට විතරක් ආදරය කරපු නිසා සෙනූ ව ඊර්ෂ්‍යා කරන්න උනන්දු වුණා. සෙනූගේ හැමදේම රන් පාටයි. සෙනූට අයිති වුනෙත් රන් පාට දේවල් විතරයි.



ඒත් යෙනුගේ හැමදේම රිදී පාටයි. යෙනුට අයිති වුනේ රිදී පාට දේවල් විතරයි. සෙනුගෙයි යෙනුගෙයි උපන් දිනය දවස ආවා.



සෙනුයි යෙනුයි ජීවත් වුන ගමේ නම වීලන්. වීලන් ගමේ සිටිය සෑම මිනිසෙක්ටම ආරංචි වුණේ සෙනූගේ උපන් දිනේ කියලා. කවුරුවත් යෙනූ කියලා කෙනෙක්ව දන්නෙවත් දැකලවත් නෑ. මිනිස්සුනන්ට සෙනූගේ උපන් දිනය කියලා ආරංචි වුණු නිසා සෑම මිනිසෙක්ම මාලිගාව වටේට සිට ගත්තා.



සෙනුයි සෙනූගේ පියයි එළියට ගියා. සෙනූ සෑම කෙනෙක්ටම අත වැනුවා. පැමිණ සිටි මිනිසුනුත් සෙනූට අත වැනුවා. යෙනූ ඒ හැම දේම බලා සිටියා. යෙනූ මාලිගාවෙන් පිටත් වුණා.



ඇය යනකොට ඇය නොදැනුවත්ව කුළුබඩු කඩයක් ලගට ආවා. ඇය දැක්කා එතන තිබෙන රන් පැහැති මුද්දක්.



ඇය ඒක මිලදී ගෙන ආපසු මාලිගාවට යනවිට ඒ මුද්ද ඇතුළේ හිරවුණු ආත්මයක් එළියට ආවා . ඒ ආත්මේ කියුවා, “ මම ඔබ ගේ සිතේ තිබෙන සියළු දේ කියෙවුවා”.



“මම ඔබට කොණ්ඩය රන් පාට වෙන බෙහෙතක් දෙනවා.ඔබ එය නාන තටාකයට දාන්න ඕනි”. ඇය එය අසා බය වී ආත්මයෙන් ඇසුවා, “ඔබ කවුද කියා”. ආත්මය කියුවා, “ මම නිකන් මුද්ද ඇතුළේ හිරවුණු ආත්මයක්” කියා. ඇය බය නැති කරගෙන ආත්මය කියූ කතාවට එකග වුණා.





ආත්මය කිවුවා, “ හැබැයි  මම ඉල්ලන රිදී දෙයක් ඕනි, ඒ කතාවටත් ඔබ එකග වෙනවද?”. ඇය ඒකට එක පාරින්ම එකග වුණා.  ඉන්පසු එම ආත්මය අතුරුදහන් වුණා.



ඇය එම ආත්මය කියූ පරිදි එම බෙහෙත නාන තටාකයට දැම්මා. ඒක යෙනූට විතරක් නෙමෙයි සෙනූටත් බලපා යෙනූගෙ කොණ්ඩය රන් පාට වී සෙනූගේ කොණ්ඩය රිදී පාට වුණා. සෙනූගේ කොණ්ඩය රන්වන් පාටට තිබූ නිසා සෙනූට ආදරය කල රජතුමා දැන් සෙනූ ට නොව රන්වන් කොණ්ඩය හිමි යෙනූට ආදරය කරනවා.



ඉන්පසු රජතුමා උනන්දු වුණේ යෙනුව රැජින කිරීමට . ඇයව සැමදා උදේ ඇහැරවීම, පාඩම් වැඩ කිරීමට හා විවිධ ක්රියාකරකම් කිරීමට දුන්නා. ඇයට එම වැඩ කර ඉතා මහන්සි දැනුණා. ඇයට සිතුණා නැවත පෙර ලෙස ජීවිතය ගත කිරීමට. එම වේලාවේ සෙනු කාමරයෙන් එළියට ආවා. එක පාරටම යෙනුගෙයි සෙනුගෙයි රජතුමාගෙයි ඉදිරියට අර ආත්මය ආවා. ආත්මය යෙනුට කියුවා, “ ඔබයි මමයි එකග වූ රිදී බඩුව ගැනීමට යි මම ආවේ”. යෙනු ඇසුවා, “ඔබට කුමන රිදී භාණ්ඩයද අවශ්යය?” කියා. අර ආත්මය කියුවා, “ මට ඕන සෙනු ව”. යෙනු කියුවා, “ මට මගේ සහෝදරිය කීයටවත් දෙන්න බැහැ” කියලා. ආත්මය

කියුවා, " ඔබේ පොරොන්දුව රකින්න" කියලා. යෙනු කියුවා, " මම බැහැ කියුවනේ . මගේ සහෝදරිය කීයටවත් දෙන්නේ නැහැ නුබට" . ආත්මයට තරහ ගොස් ආත්මය රාක්ෂයෙක් වුණා.



ඒ රාක්ෂයෙක් වූ ආත්මය සැනෙකින් සෙනූ ව අල්ලා ගත්තා. සෙනූ කෑගැහුවා බේර ගන්න කියලා. යෙනූ කෑ ගැසුවා "අනේ මගේ සහෝදරියව අතහරින්න" කියලා . යෙනූ ට මතක් වුණා ආත්මය දුන් බෙහෙත. ඇය එය රැගෙන ඇගේ කොණ්ඩයට එම බෙහෙත දා ගත්තා. එවිට යෙනූගේ කොණ්ඩය තිබූ ලෙසම රිදී පාට වී සෙනූගේ කොණ්ඩය රන් පාට වුණා.

යෙනූ කෑගසා මෙසේ කියුවා . "දැන් සෙනූ ගේ කොණ්ඩය රන් පාටයි. මගේ කොණ්ඩය රිදී පාටයි. දැන් ඔබ මාව අල්ලා ගන්න". ඒ විගසම රාක්ෂයා

නැවත ආත්මයක් ලෙස වෙනස් වී සෙනුව අතහැරියා.

ආත්මේ දූකෙන් මෙසේ පැවසුවා. “මම දවසක් නිදාගෙන ඉන්න කොට මායාකාරියක් ආවා. එයා මාව රන් මුදුවක සිර කරා. ඒක රිදී කුමාරිකාවක් හෝ රිදී කුමාරයෙක් ඇල්ලුවොත් මම නිදහස් වන බවත් ඒ මායාකාරිය පැවසුවා”. “ඉතිං ඒකයි මං මෙහෙම දෙයක් කළේ. දැං මම රිදී කුමාරිකාවක් ඇල්ලුව නිසා මං නිදහස්”. එක පාරටම එම ආත්මය අතුරුදහන් වුණා. එය දෙස බලාසිටි රජතුමා මෙසේ කියූවා. “මම මේ අවුරුදු ගානටම රන්පැහැ කොණ්ඩය ඇති කුමාරිකාවට පමණයි ආදරය කළේ.

නමුත් අද ඉදන් මන් කුමාරිකාවන් දෙදෙනාටම ආදරය කරනවා”. ඉන්පසු සෙනූ යි යෙනූ යි රජතුමායි සතුටින් ජීවත් වුණා.



**පසුවදන**

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

**2023.10.20**